## දැක්ම

යහපත් රාජ්‍ය පාලනයක් ඇති කිරීම සඳහා නොයෙකුත් රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කරමින් ශ්‍රී ලංකා ජනරජයට සහාය වීම.

## මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්තීන්, නීතිය බවට පරිවර්තනය කිරීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, ඊට අදාළ පනත් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා තුනෙන් ම සම්පාදනය කිරීම

## හැඳින්වීම

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව "ඒ" ශ්‍රේණියේ රාජ්‍ය දෙපාර්තමේන්තුවකි. මෙම දෙපාර්තමේන්තුව අංක 1651/20 හා 2010.04.30 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව අතිගරු ජනාධිපතිතුමාගේ සෘජු අධීක්ෂණය යටතේ පවතී.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යභාරය වනුයේ, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද තීරණ අනුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව, විවිධ විෂයයන් පිළිබඳ රාජ්‍ය ප්‍රතිපත්තීන් ලිඛිත නීතිය බවට පරිවර්තනය කිරීම ය. එසේ රාජ්‍ය ප්‍රතිපත්තීන් නීතිය බවට පරිවර්තනය කිරීමේ කාර්යාවලියේ දී දෙපාර්තමේන්තුව විසින්, නව පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය කිරීමේ පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම සහ අදාළ අමාත්‍යාංශවලින් ඉදිරිපත් කරන අනුනීති ප්‍රතිශෝධනය කිරීම සිදු කරයි. පනත් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගීවීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේ දී පාර්ලිමේන්තුව සමඟ අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම ද දෙපාර්තමේන්තුවට පැවරී ඇති රාජකාරි කටයුතු වේ. මෙම දෙපාර්තමේන්තුව, සියලු රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ද ඇතුළු සෑම අමාත්‍යාංශයක් හා දෙපාර්තමේන්තුවක් වෙත සේවා සලසයි. පනත් කෙටුම්පත් සහ අනුනීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් අමාත්‍යාංශ හා රාජ්‍ය දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද, දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලබන රාජකාරියකි.

**1. පනත් කෙටුම්පත් සම්පාදනය කිරීමට අදාළව දෙපාර්තමේන්තුවේ කර්තව්‍ය වනුයේ :-**

(1) නව නීති පැනවීම සඳහා ද පවත්නා නීති සංශෝධනය කිරීම සඳහා ද භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම.

(2) අනු නීති භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම සහ (අවශ්‍ය අවස්ථාවල දී) අනු නීති කෙටුම්පත් කිරීම.

(3) පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් නෛතික උපදෙස් ලබා දීම.

(4) ව්‍යවස්ථා සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීම.

(5) පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම,

(6) පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් (සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත්) භාෂාත්‍රයෙන් ප්‍රතිශෝධනය කිරීම.

(7) අවස්ථාවෝචිත පරිදි, අදාළ රේඛීය අමාත්‍යාංශවල පූර්ණ සහයෝගය සහ අනුමැතිය ඇතිව නීති කෙටුම්පත් සම්පාදනයට අදාළ රාජ්‍ය ප්‍රතිපත්තීන් ප්‍රායෝගිකව, සාර්ථකව ක්‍රියාත්මක කළ හැකි වන පරිදි ප්‍රතිනිර්මාණය කිරීම.

මෙම දෙපාර්තමේන්තුවේ විශේෂ ලක්ෂණය වන්නේ, එයටම සීමා වූ වැඩසටහනක් නොතිබීම යි. අමාත්‍ය මණ්ඩලය විසින් නියමිත ප්‍රතිපත්ති අනුමත කිරීමෙන් පසුව, රජයේ අමාත්‍යාංශවල හා එම අමාත්‍යාංශ යටතේ ඇති දෙපාර්තමේන්තුවල ව්‍යවස්ථා සම්පාදක අවශ්‍යතා මත දෙපාර්තමේන්තුවේ වැඩසටහන සකස් වී තිබීම ඊට හේතුව යි. එබැවින් නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය, යම් නිශ්චිත වර්ෂයක් මුළුල්ලේ ප්‍රාථමික ව්‍යවස්ථා, ව්‍යවස්ථා සංශෝධන හා අනුනීති සඳහා අදාළ රේඛීය අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් හා එම ඉල්ලීම් සාර්ථකව නිම කිරීම යන පදනම මත සකස් වී ඇත. දෙපාර්තමේන්තුවේ මූලික කාර්ය භාරය වන නීති සම්පාදනයෙහි විෂය පථයට ඇතුළත් වන කවර ආකාරයක හෝ වූ නීති, එය ඉල්ලා සිටින අමාත්‍යාංශයට හෝ දෙපාර්තමේන්තුවට මුද්‍රා හැරීමට පෙර භාෂා තුනෙන් ම සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.

## 2. කාර්ය මණ්ඩලය

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි වේ. අනුමත ඒකාබද්ධ කාර්ය මණ්ඩලය 151 ක් වන අතර 2013 වර්ෂයේ සේවයේ නියුතුව සිටි කාර්ය මණ්ඩලය 79 ක් වේ.

| තනතුරු වර්ග | අනුමත කාර්ය මණ්ඩලය | සේවයේ නියුතුව සිටි කාර්ය මණ්ඩලය |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 27 |
| තෘතීය මට්ටම | 28 | 04 |
| ද්විතීය මට්ටම | 62 | 28 |
| ප්‍රාථමික මට්ටම | 24 | 20 |

| නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2013.12.31 දිනට කාර්ය මණ්ඩලය | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | | | තෘතීය මට්ටම | | | ද්විතීය මට්ටම | | | ප්‍රාථමික මට්ටම | | |
| | අනුමත | තත්‍ය | | අනුමත | තත්‍ය | | අනුමත | තත්‍ය | | අනුමත | තත්‍ය |
| නීති කෙටුම්පත් සම්පාදක | 01 | 01 | පරිපාලන නිලධාරී | 01 | 01 | අයවැය සහකාර | 01 | 01 | රියදුරු | 10 | 07 |
| අතිරේක නීති කෙටුම්පත් සම්පාදක | 01 | 01 | ප්‍රධාන භාෂා පරිවර්තක | 02 | 02 | ගිණුම් සහකාර | 01 | 01 | කාර්යාල කාර්ය සහායක | 14 | 13 |
| නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක | 05 | 05 | භාෂා පරිවර්තක | 24 | 01 | පුස්තකාලයාධිපති | 01 | 01 | | | |
| ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 08 | 03 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 | - | රාජ්‍ය කළමනාකරණ සහකාර | 28* | 24 | | | |
| සහකාර නීති කෙටුම්පත් සම්පාදක | 20 | 16 | | | | ලේඛන සහකාර | 20 | - | | | |
| ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | | | | සංස්කාරක | 11 | 01 | | | |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ | 01 | - | | | | | | | | | |
| එකතුව | 37 | 27 | | 28 | 04 | | 62 | 28 | | 24 | 20 |
| මුළු එකතුව | | | | අනුමත ගණන 151 | | | තත්‍ය ගණන 79 | | | | |

*රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 28 දෙනෙකු අනුමත අතර, ලේඛන සහකාර 20 දෙනෙකු බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇති බැවින්, එසේ බඳවාගත් පසු රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් 20 දක්වා අඩු කිරීමට නියමිතය.

## දෙපාර්තමේන්තුවේ පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග

දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්යභාරය ඉටුකිරීම සඳහා අනුමත සේවක සංඛ්‍යාව 151 කි. එසේ වුව ද එකී කාර්යභාරය ඉටුකිරීම සඳහා දෙපාර්තමේන්තුවේ 2013 වර්ෂයේ සිටි නිත්‍ය සේවක සංඛ්‍යාව 79 ක් පමණි. මෙහි පහත දක්වා ඇති පරිදි විවිධ සේවා ගණවල සේවා නියුක්තිය සම්බන්ධයෙන් පුරප්පාඩු 72 ක් පිරවීමට තිබේ :-

**ජ්‍යෙෂ්ඨ මට්ටම**

(අ) ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක තනතුරු 05 ක් පුරප්පාඩු වී පවතී. අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව, සුදුසුකම්ලත් සහකාර නීති කෙටුම්පත් සම්පාදක නිලධාරීන් නොමැති බැවින් එය සම්පූර්ණ කිරීමට නොහැකිව පවතී.

(ආ) සහකාර නීති කෙටුම්පත් සම්පාදක පුරප්පාඩු තනතුරු සංඛ්‍යාව 04 කි. එම පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු සිදු කරමින් පවතී.

(ඇ) පුරප්පාඩුව පවතින ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II/ III පන්තියේ නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ තනතුර සඳහා නිලධාරියෙක් ලබා දෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ලිඛිතව ඉල්ලීමක් කර ඇති අතර ඒ සඳහා සුදුසු නිලධාරියෙක් ලැබුණු පසු ලබාදෙන බව දන්වා ඇත.

**තෘතීය මට්ටම**

භාෂා පරිවර්තක තනතුරු පුරප්පාඩු සංඛ්‍යාව 23 කි. භාෂා පරිවර්තකවරුන් බඳවා ගැනීමේ පරිපාටියෙහි වයස් සීමාවෙහි සංශෝධන අනුමැතිය ලබා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර අනුමැතිය ලැබුණු පසු බඳවා ගැනීමට කටයුතු කිරීමට නියමිත ය.

**ද්විතීය මට්ටම**

ලේඛන සහකාර සහ සංස්කාරක තනතුරුවල පුරප්පාඩු 30 ක් පවතී. එහෙත් අදාල බඳවා ගැනීමේ පරිපාටිය සඳහා මෙතෙක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී නොමැති බැවින් බඳවා ගැනීමේ කටයුතු සිදු කිරීමට නොහැකි විය. කෙසේ වුව ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලැබුණු පසු බඳවා ගැනීමේ කටයුතු සම්පූර්ණ කිරීමට නියමිත ය.

**ප්‍රාථමික මට්ටම**

කාර්යාල කාර්ය සහායක සේවයේ පුරප්පාඩු සංඛ්‍යාව 01 කි. එම පුරප්පාඩුව පිරවීම සම්බන්ධයෙන් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇත.

**3. දෙපාර්තමේන්තුවේ අංශ**

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්යය පහත සඳහන් අංශ මඟින් ක්‍රියාත්මක වේ.

නීති කෙටුම්පත් සම්පාදන අංශය

ආයතන හා පාලන අංශය

භාෂා පරිවර්තන අංශය

ප්‍රකාශන අංශය

ගිණුම් අංශය

# නීති කෙටුම්පත් සම්පාදන අංශය

**ක්‍රියාත්මක කරන ප්‍රධාන කාර්යයන් ඃ-**

- රාජ්‍ය ප්‍රතිපත්ති නීතිය බවට පරිවර්තනය කිරීම.
- නව නීති පැනවීමට සහ නීති සංශෝධනය කිරීමට භාෂාත්‍රයෙන් පනත් කෙටුම්පත් සකස් කිරීම.
- නොයෙකුත් රාජ්‍ය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට පනත් කෙටුම්පත් සම්බන්ධයෙන් නෛතික උපදෙස් ලබා දීම.
- ව්‍යවස්ථා සම්පාදනය හා සම්බන්ධ පාර්ලිමේන්තු රාජකාරි ඉටු කිරීම.
- පළාත් සභා සඳහා ප්‍රඥප්ති කෙටුම්පත් කිරීම.

<u>**2013 වර්ෂයට අදාළ පනත් කෙටුම්පත් සම්බන්ධ විස්තර සටහන**</u>

| | කෙටුම්පත් කිරීම (වර්ෂය මුල) | වර්ෂය තුළ පාර්ශවයන් වෙතින් ලැබුණු ඉල්ලුම් සංඛ්‍යාව | පවතින පනත් සඳහා ලද නව ඉල්ලීම් | එකතුව | කෙටුම්පත් සකස් කර අදාළ පාර්ශවයන් වෙත ලබාදුන් සංඛ්‍යාව | වසන ලද ගොනු | සම්බන්ධ කරන ලද ගොනු | කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලුම් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| පනත් කෙටුම්පත් කිරීම නව නීති හා සංශෝධන නීති | 154 | 49 | 3 | 206 | 46 | 6 | - | 154 |
| පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත් | 63 | 43 | 8 | 114 | 19 | - | - | 95 |
| පළාත් සභා ප්‍රඥප්ති | 18 | 2 | - | 20 | - | - | - | 20 |
| උපකාරක නීති (නියෝග, රීති, නියමයන් ආදිය) | 73 | 13 | 93 | 179 | 77 | 1 | - | 101 |

**2013 වර්ෂය තුල සම්මත කර ගන්නා ලද පනත් කෙටුම්පත්**

| අනු අංකය | පනත් කෙටුම්පතෙහි නම | | |
|---|---|---|---|
| 01 | 01/2013 | **LDO 13/2013** | දිවිනැගුම |
| 02 | 02/2013 | **LDO 51/2011** | අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) |
| 03 | 03/2013 | **LDO 30/2012** | ත්‍රස්තවාදීන්ට මුදල් සැපයීම මැඩපැවැත්වීම් සම්මුති (සංශෝධන) |
| 04 | 04/2013 | **LDO INC 1/2012** | ලංකා ශාන්ත ජෝශප් සහොයුරන්ගේ සංගමය (සංශෝධන) |
| 05 | 05/2013 | **LDO 12/2013** | වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු (සංශෝධන) |
| 06 | 06/2013 | **LDO 01/2013** | ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) |
| 07 | 07/2013 | **LDO 08/2013** | සුරාබදු (සංශෝධන) |
| 08 | 08/2013 | **LDO 10/2013** | විදුලි සංදේශ බදු(සංශෝධන) |
| 09 | 09/2013 | **LDO 24/2013** | රේගු (සංශෝධන) |
| 10 | 10/2013 | **LDO 41/2012** | නැවත පදිංචි කරවීමේ අධිකාරිය (සංශෝධන) |
| 11 | 11/2013 | **LDO 07/2013** | ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) |
| 12 | 12/2013 | **LDO 05/2013** | මුදල් |
| 13 | 13/2013 | **LDO 20/2013** | නොතාරිස් (සංශෝධන) |
| 14 | 14/2013 | **LDO 19/2013** | ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) |
| 15 | 15/2013 | **LDO 14/2013** | මූල්‍ය කළමණාකරණ (වගකීම්) (සංශෝධන) |
| 16 | 16/2013 | **LDO 11/2013** | ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) |
| 17 | 17/2013 | **LDO 02/2013** | එකතු කළ අගය මත බදු |

| | | | |
|---|---|---|---|
| 18 | 18/2013 | **LDO 13/2013** | දේශීය ආදායම් (සංශෝධන) |
| 19 | 19/2013 | **LDO 03/2013** | ඔට්ටු ඇල්ලීම සහ සූදු බදු (සංශෝධන) |
| 20 | 20/2013 | **LDO 09/2013** | බදු අභියාචනා කොමිෂන් සභාව (සංශෝධන) |
| 21 | 21/2013 | **LDO 18/2013** | ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) |
| 22 | 22/2013 | **LDO 06/2013** | විවාහ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත |
| 23 | 23/2013 | **LDO 15/2013** | උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන) |
| 24 | 24/2013 | **LDO 16/2013** | මුස්ලිම් විවාහ හා දික්කසාද (සංශෝධන) |
| 25 | 25/2013 | **LDO 17/2013** | උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ (සංශෝධන) |
| 26 | 26/2013 | **LDO INC 20/2011** | හඟුරන්කෙත මාදන්වල රජමහා විහාර සංවර්ධන පදනම (සංස්ථාගත කිරීමේ) |
| 27 | 27/2013 | **LDO 32/2013** | ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේ (විශේෂ විධිවිධාන) |
| 28 | 28/2013 | **LDO 03/2012** | පාර්ලිමේන්තු ශිෂ්‍යත්ව මණ්ඩලය (ඉවත් කිරීමේ) |
| 29 | 29/2013 | **LDO 17/2012** | රාජ්‍ය ආරක්ෂක සේවා අණ සහ මාණ්ඩලික විද්‍යාලය (සංශෝධන) |
| 30 | 30/2013 | **LDO 31/2012** | පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) |
| 31 | 31/2013 | **LDO 21/2009** | ශ්‍රී ලංකා විදුලි බල (සංශෝධන) |
| 32 | 32/2013 | **LDO 20/2012** | විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ (සංශෝධන) |
| 33 | 33/2013 | **LDO 17/2011** | ක්‍රීඩාවල යෙදීමේ දී උත්තේජක ද්‍රව්‍ය ගැනීමට එරෙහි සම්මුති |

| | | | |
|---|---|---|---|
| 34 | 34/2013 | **LDO 27/2012** | බෞද්ධ විහාර දේවාලගම් (සංශෝධන) |
| 35 | 35/2013 | **LDO 01/2012** | ධීවර සහ ජලජ සම්පත් (සංශෝධන) |
| 36 | 36/2013 | **LDO 44/2013** | විසර්ජන |

සටහන :

- එල්.ඩී.ඕ. යනුවෙන් අදහස් වන්නේ ප්‍රාරම්භක හා සංශෝධන පනත් කෙටුම්පත් ලිපිගොනු වේ.

- එල්.ඩී.ඕ. අයි.එන්.සී. යනුවෙන් අදහස් වන්නේ සංස්ථාගත කිරීමේ පනත් කෙටුම්පත් ලිපිගොනු වේ.

## ආයතන අංශය හා පාලන අංශය

ආයතන හා පාලන අංශය මගින් කාර්ය මණ්ඩලය බඳවා ගැනීම, උසස් කිරීම, පුහුණු කිරීම, කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම හා විනය කටයුතු, වාහන හා සම්බන්ධ කටයුතු සහ අනෙකුත් සියලු ආයතනික හා පරිපාලන කටයුතු ඉටු කරනු ලබයි.

### (1) බඳවා ගැනීම, උසස් කිරීම් සහ විනය පාලනය

i. දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු වූ නීති කෙටුම්පත් සම්පාදක, අතිරේක නීති කෙටුම්පත් සම්පාදක, නියෝජ්‍ය නීති කෙටුම්පත් සම්පාදක තනතුරු පිරවීම උසස්වීම් සම්බන්ධයෙන් කටයුතු කරන ලද අතර, ඒ අදාළ පුරප්පාඩු පිරවීමට පියවර ගන්නා ලදී.

ii. පුරප්පාඩුව පැවති රියදුරු තනතුරු 04 ක් සඳහා බඳවා ගැනීමට කටයුතු කරන ලදී.

iii. දැනට එක් නීති නිලධාරියෙකුට චෝදනා පත්‍රයක් නිකුත් කර ඇති අතර විනය පරීක්ෂණය සිදු කෙරෙමින් පවතී.

iv. දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින භාෂා පරිවර්තක තනතුරු සඳහා බඳවා ගන්නා තෙක් භාෂා පරිවර්තක සංචිතයක් ඇති කිරීම සඳහා අයදුම්පත් කැඳවා ලිඛිත පරීක්ෂණයක ප්‍රතිඵල මත භාෂා පරිවර්තක සංචිතයක් ඇති කරන ලදී.

### (2) පුහුණු කිරීම්

**දේශීය පුහුණු**

දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පහත සඳහන් පරිදි දේශීය පුහුණුවීම් සඳහා යොමුකර ඇත.

i. *රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව (මිලෝදා)*

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය - 01

ii. *රාජ්‍ය සේවා පුහුණු ආයතනය*

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය - 02

iii. *ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය*

| | |
|---|---|
| නීති නිලධාරීන් | - 06 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | - 03 |
| කාර්යාල සේවක සේවය | - 01 |

iv. *රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව*

| | |
|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | - 04 |

v. *රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව*

| | |
|---|---|
| නීති නිලධාරීන් | - 01 |

vi. *නිපුණතා සංවර්ධන පදනම*

| | |
|---|---|
| නීති නිලධාරීන් | - 01 |
| මාණ්ඩලික නිලධාරීන් | - 01 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | - 02 |
| කාර්යාල සේවක සේවය | - 07 |

ඉහත දක්වා ඇති පුහුණුවීම් හැර, නීති නිලධාරීන් සහ අනෙකුත් මාණ්ඩලික නිලධාරීන් දේශීය වැඩමුළු 07 කට සහ සම්මන්ත්‍රණ 07 කට සහභාගී කරවන ලදී.

මීට අමතරව, නීති කෙටුම්පත් සම්පාදනය කිරීමේ කටයුතු කාර්යක්ෂමව ඉටු කිරීමට විශේෂ ඉංග්‍රීසි දැනුමක් ලබා දීම සඳහා සහකාර නීති කෙටුම්පත් සම්පාදක නිලධාරීන් වෙනුවෙන් Advance Business Writing (පාඨමාලාව මාස 03 ක කාලයක්) මෙම දෙපාර්තමේන්තුව තුළ දී පවත්වන ලදී.

දෙපාර්තමේන්තුවේ කාර්යයන් වඩාත් ඵලදායී ලෙස ඉටු කරවා ගැනීම සඳහා කොළඹ විශ්ව විද්‍යාලයේ නීති පීඨය මගින් මෙහෙයවනු ලබන පශ්චාත් නීති උපාධි පාඨමාලාව (2013 - 2014) හැදෑරීම සඳහා නීති නිලධාරීන් 04 දෙනෙකු වෙනුවෙන් ප්‍රතිපාදන ලබා දීමට කටයුතු කරන ලදී.

පුස්තකාලයාධිපතිනිය ශ්‍රී ලංකා පුස්තකාල සංගමයේ එක් සම්මන්ත්‍රණයකට සහභාගී කර ඇත.

**විදේශීය පුහුණු**

i. දෙපාර්තමේන්තුවේ නීති කෙටුම්පත් සම්පාදකවරයා දකුණු අප්‍රිකාවේ සමගාමීව පැවති පොදු රාජ්‍ය මණ්ඩලයේ නීති සමුළුවට සහ නීති කෙටුම්පත් සම්පාදකවරුන්ගේ සමුළුවට සහභාගි විය.

ii. බංගලාදේශයේ පැවති අන්තර් ජාතික මානුෂික නීතිය පිළිබඳ පුහුණු වැඩමුළුවක් සඳහා අතිරේක නීති කෙටුම්පත් සම්පාදකවරිය සහභාගී විය.

iii. ඉන්දියාවේ පැවති ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ පාඨමාලාවකට ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරියක් ද සහභාගි විය. ඇමරිකා එක්සත් ජනපදයේ නිව් ඔර්ලීන්ස්හි පැවති ව්‍යවස්ථා සම්පාදන පාඨමාලාවකට තවත් ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදකවරියක් සහභාගි විය.

<u>**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වූ විදේශ සම්මන්ත්‍රණ, රැස්වීම් - 2013 වර්ෂය**</u>

| | **සම්මන්ත්‍රණයේ නම සහ පැවැත්වූ රට** | **සහභාගී වූ නිලධාරියාගේ නම** |
|---|---|---|
| 1. | පොදු රාජ්‍ය මණ්ඩල සම්මේලනයේ ව්‍යවස්ථා කටයුතු සම්පාදකවරුන්ගේ සම්මේලනය 2013 - දකුණු අප්‍රිකාව<br><br>18 වෙනි පොදු රාජ්‍ය මණ්ඩලීය නීති සම්මේලනය - 2013 - දකුණු අප්‍රිකාව | නීති කෙටුම්පත් සම්පාදක ජී.එස්.ඒ. ද සිල්වා මයා |

**<u>නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් සහභාගී වූ විදේශ පුහුණු 2013 වර්ෂය</u>**

| | පුහුණුවේ නම සහ පැවැත් වූ රට | පුහුණුව සඳහා සහභාගී වූ නිලධාරියාගේ නම |
|---|---|---|
| 1. | ජාත්‍යන්තර මානව නීතිය පිළිබඳ 23 වන දකුණු ආසියාතික ශික්ෂණ සැසිය - බංගලාදේශය | අතිරේක නීති කෙටුම්පත් සම්පාදක ඩී.එස්.එච්.කුමාරජීව මිය |
| 2. | ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන - ඉන්දියාව<br><br>ව්‍යවස්ථා සම්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන - ඇමරිකා එක්සත් ජනපදය | ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක එස්.එස්.එම්.ඩී.ඊ.වීරකෝන් මිය<br><br>ජ්‍යෙෂ්ඨ සහකාර නීති කෙටුම්පත් සම්පාදක ඩී.ඩී.වීරක්කොඩි මිය |

## (3) අනෙකුත් ආයතනික හා පාලන කටයුතු

i. දේශීය හා විදේශීය නීතිමය තත්ත්වයන් පිළිබඳව නිලධාරීන්ගේ දැනුම හා හැකියාව වර්ධනය උදෙසා දෙපාර්තමේන්තුවේ 1 ශ්‍රේණියේ පුස්තකාලයක් ස්ථාපිතව ඇති අතර, 2013 වර්ෂයේ දේශීය හා විදේශීය නීති පොත් 14 ක් මිළදී ගෙන ඇත.

ii. සේවක සුභසාධනය වෙනුවෙන් පොදු සුභසාධක සංගමයක් පවතී. එමගින් 2013 වර්ෂයේදී, සාමාජිකයන් සඳහා ණය පහසුකම් සැපයීම, කාර්ය මණ්ඩල අතර සුහදතාවය වර්ධනය කිරීම උදෙසා විනෝද චාරිකා සංවිධානය කිරීම සහ මානසික සංවර්ධනය උදෙසා ආගමික වැඩසටහන් සංවිධානය කිරීම සිදු කරන ලදී.

iii. නීති නිලධාරීන්ගේ සුභසාධනය වෙනුවෙන් නීති නිලධාරීන්ගේ සංගමයක් ද ඇත. නීති නිලධාරීන්ගේ වෘත්තිමය නිපුණතා වර්ධනය මෙන්ම අනෙකුත් සුභසාධන කටයුතු මෙම සංගමය මගින් ඉටු කරයි.

iv. දෙපාර්තමේන්තුවේ සියලුම පරිගණක ජාලගත කර ඇති අතර, සියලුම මාණ්ඩලික නිලධාරීන් මෙන්ම අනෙකුත් සුදුසු නිලධාරීන් සඳහා පරිගණක

හා අන්තර්ජාල පහසුකම් ලබා දී ඇත. අනෙකුත් නිලධාරීන්ට ද පරිගණක හා අන්තර්ජාල ප්‍රවේශ පහසුකම් ලබා දී ඇත. සියලුම නිලධාරීන්ට නව තාක්ෂණය භාවිතා කිරීමට අවස්ථාව ලබාදීම මගින් e-රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කර ඇත.

## භාෂා පරිවර්තන අංශය

මෙම දෙපාර්තමේන්තුවේ නීති අංශය මඟින් ඉංග්‍රීසි බසින් සකස් කරනු ලබන නීති කෙටුම්පත් (පනත් සහ සංශෝධන පනත්) සහ ප්‍රතිශෝධනය කරනු ලබන අනුනීති, අදාළ භාෂාවලට පරිවර්තනය කිරීම සහ දෙපාර්තමේන්තුවේ ආයතන, පාලන සහ ගිණුම් අංශවල රාජකාරි ලිපිලේඛන අදාළ භාෂාවලට පරිවර්තනය කිරීම භාෂා පරිවර්තන අංශය මඟින් සිදු කරනු ලබයි.

## ප්‍රකාශන අංශය

පනත් කෙටුම්පත් හා අනුනීතිවල ඉංග්‍රීසි, සිංහල හෝ දෙමළ පිටපත්වල සෝදුපත් බැලීම, පරීක්ෂා කිරීම ද පාර්ලිමේන්තුව හා රජයේ මුද්‍රණාලය විසින් එවනු ලබන පනත් කෙටුම්පත්වල අත් පිටපත් හා ගුරු පිටපත් කියවා බැලීම ද නීති නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ එවැනි පිටපත් හා සම්බන්ධ සංස්කරණ කටයුතු සිදු කිරීම කරන අතරවාරයේ දී දෙපාර්තමේන්තුව සහ පාර්ලිමේන්තුව අතර සම්බන්ධීකරණ කටයුතු කිරීම ද, පනත් ගැසට් පත්‍රයේ පළ කිරීමට පියවර ගැනීම යනාදී කටයුතු නිසි ආකාරයෙන් සිදු කිරීම ද මෙම අංශය මඟින් සිදුකරනු ලබයි.

# ගිණුම් අංශය

## 015 නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

**2013.01.01 - 2013.12.31**

**වැය විස්තරය**

ශීර්ෂය : 015 - නීති කෙටුම්පත් සම්පාදක

වැඩසටහන : 01 මෙහෙයුම්

ව්‍යාපෘතිය : 01 සාමාන්‍ය පරිපාලනය හා නීති කෙටුම්පත් කිරීම

(අ) 2013.01.01 සිට 2013.12.31 දක්වා පුනරාවර්තන වියදම්

| පුනරාවර්තන වියදම් පිළිබඳ විස්තර | අයවැය ප්‍රතිපාදන (රු.) | ශුද්ධ ප්‍රතිපාදන (රු.) | මුලු වියදම් (රු.) |
|---|---|---|---|
| පුද්ගල පඩිනඩි | 38,290,000 | 38,290,000 | 34,587,149 |
| අනෙකුත් වියදම් | 20,765,000 | 29,765,000 | 24,330,269 |
| **පුනරාවර්තන වියදම්වල එකතුව** | **59,055,000** | **68,055,000** | **58,917,418** |

2013.01.01 සිට 2013.12.31 දක්වා ප්‍රාග්ධන වියදම්

| ප්‍රාග්ධන වියදම් පිළිබඳ විස්තර | අයවැය ප්‍රතිපාදන (රු.) | ශුද්ධ ප්‍රතිපාදන (රු.) | මුලු වියදම් (රු.) |
|---|---|---|---|
| **මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | | | |
| 2001 - ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 50,000 | 50,000 | 41,714 |
| **මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | | | |
| 2102 - ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ | 500,000 | 500,000 | 209,600 |
| **මානව සම්පත් සංවර්ධනය** | | | |
| 2401 - කාර්ය මණ්ඩල පුහුණු (අ) | 7,000,000 | 7,000,000 | 3,523,226 |

| | | | |
|---|---|---|---|
| **<u>වෙනත් මූලධන වියදම්</u>**<br><br>2502 - ආයෝජන - නීති ග්‍රන්ථ මිලදී ගැනීම | 3,000,000 | 3,000,000 | 2,310,810 |
| **<u>ශ්‍රී ලංකා නිති ප්‍රඥප්ති ප්‍රතිශෝධනය කිරීම</u>**<br><br>2502 - ආයෝජන | 40,000,000 | 40,000,000 | - |
| **ප්‍රාග්ධන වියදම්වල එකතුව** | **50,550,000** | **50,550,000** | **6,085,350** |

(ආ) 2013.01.01 සිට 2013.12.31 දක්වා ආදායම් විස්තරය

| **විස්තරය** | **ඇස්තමේන්තුගත ආදායම (රු.)** | **ආදායම (රු.)** |
|---|---|---|
| පොළිය - වෙනත් | 550,000 | 3,433,466.41 |

(ආ) අත්තිකාරම් ගිණුම - 015011
(2013.01.01 - 2013.12.31)

| | **වියදමෙහි උපරිම සීමාව (රු.)** | **ලැබීම්වල අවම සීමාව (රු.)** | **හර ශේෂයන්ගේ උපරිම සීමාව (රු.)** |
|---|---|---|---|
| 2013 ඇස්තමේන්තුව | 5,300,000 | 2,000,000 | 24,000,000 |
| මු.රෙ. 503(1) - 2014.12.31 දිනට ගැලපීම් කිරීමට පෙර | 3,740,551 | 5,371,417 | 12,532,391 |

ඩී.ජී.එස්.ඒ - 1

# විසර්ජන ගිණුම 2013

වියදම් ශීර්ෂ අංකය: 015

~~අමාත්‍යාංශයේ~~/දෙපාර්තමේන්තුවේ/~~දිස්ත්‍රික්ලේකම් කාර්යාලයේ~~ නම : නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | | (1) | (2) | (3) | (4) | (5) | (6) | |
|---|---|---|---|---|---|---|---|---|
| | වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම | පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම | මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම | මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3) | මුළු වියදම | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මීම (4-5) | පිටු අංකය (අදාල ඩී.ජී.එස්.ඒ 2 ආකෘතියට අනුව) |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | |
| | පුනරාවර්තන | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | 59,055,000 | 9,000,000 | - | 68,055,000 | 58,917,418 | 9,137,582 | 2 |
| | උප එකතුව (පුනරාවර්තන) | 59,055,000 | 9,000,000 | | 68,055,000 | 58,917,418 | 9,137,582 | |
| | මූලධන | | | | | | | |
| 1 | මෙහෙයුම් වැඩසටහන | 50,550,000 | - | - | 50,550,000 | 6,085,350 | 44,464,650 | 2 |
| | උප එකතුව (මූලධන) | 50,550,000 | | | 50,550,000 | 6,085,350 | 44,464,650 | |
| | මුළු එකතුව | 109,605,000 | 9,000,000 | - | 118,605,000 | 65,002,768 | 53,602,232 | |

පිටු අංක 02 සිට 15 දක්වා ඩී.ජී.එස්.ඒ 2 සිට ඩී.ජී.එස්.ඒ 10 දක්වා වූ ආකෘති පත්‍ර වලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් අංක 16 සිට 20 දක්වා ඇතුලත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාල ගිණුම් තොරතුරු හා සටහන් වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාල ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිළධාරි
නම : ලලිත් වීරතුංග
තනතුර : ජනාධිපති ලේකම්
දිනය : 2014-03-19

ගණන්දීමේ නිළධාරි
නම :
තනතුර :
දිනය : 2014 /03 /14

ප්‍රධාන ගණකාධිකාරී/ ~~අධ්‍යක්ෂ (මුදල්)/කොමසාරිස් (මුදල්)~~
නම :
දිනය : 2014/3/14

ජී එස් ඒ ද සිල්වා
නීති කෙටුම්පත් සම්පාදක
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
80 අධිකරණ මාවත
කොළඹ 12

ඩී.පී.එස්.ඒ - (විගණන)

# 2013 - විසර්ජන ගිණුම් සඳහා විගණකාධිපතිගේ නිරීක්ෂණය

...ශයේ/දෙපාර්තමේන්තුවේ/~~දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ~~ නම: නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

26 MAY 2014
26/5

විසර්ජන ගිණුම - 2013

ශීර්ෂ අංක - 15 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

---

විගණන නිරීක්ෂණ

---

(1) වැය විෂයයන් 02 ක් යටතේ වෙන් කර තිබූ එකතුව රු. 40,010,000 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(2) වැය විෂයයන් 04 ක් සඳහා වෙන් කරන ලද රු. 13,175,000 ක් වූ ප්‍රතිපාදනයෙන් රු. 8,010,733 ක් ඉතිරි වී තිබූ අතර එය වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් 50% සිට 76% දක්වා වූ පරාසයක විය.

(3) මු.රෙ 94 විධිවිධාන ප්‍රකාරව දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්මවිය යුතු වුවත් වැය විෂයයන් දෙකක ඉතිරිවීම් ඉක්මවා රු. 325,279 ක් වූ බැරකම් වලට බැඳී තිබුණි.

ඩී. එම්. බී. ගයනකාන්ත
නියෝජ්‍ය විගණකාධිපති
2014/05/23

## විගණකාධිපති සටහන

----------------------------

2012 අංක 23 දරන විසර්ජන පනතේ පළමු උපලේඛනයේ ශීර්ෂ 15 ට අදාල නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2013 වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ, මුදල් රෙගුලාසි 150 හා 2013 දෙසැම්බර් 06 දිනැති අංක 233/2013 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව විගණනයට ඉදිරිපත් කරන ලදී. එකී විසර්ජන ගිණුම භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සහ අයවැය ඇස්තමේන්තු සහ කාර්යාලයේ පොත්පත්, ලේඛන හා වාර්තා සමඟ පරීක්ෂා කරන ලද අතර, එම ගිණුමට අදාල විගණන නිරීක්ෂණ මෙයට යා කර ඇත. වැය ශීර්ෂයට අදාල විගණන නිරීක්ෂණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

.............................................

ඒ. එම්. ඩී. නයනකාන්ත
නියෝජ්‍ය විගණකාධිපති

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

2014 මැයි ....23........ දින,

විගණකාධිපති දෙපාර්තමේන්තුවේදිය.

## ආයතනයේ කාර්ය සාධනය පිළිබඳ සාරාංශය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව විවිධ විෂයන් පිළිබඳව රාජ්‍ය ප්‍රතිපත්තීන් ලිඛිත නීතිය බවට පරිවර්තනය කිරීම නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය වේ. මෙම ක්‍රියාවලියේ දී නව පනත් කෙටුම්පත් සම්පාදනය කිරීම, පවත්නා නීති සංශෝධනය (amendment) කිරීම, පනත් කෙටුම්පත් ප්‍රතිශෝධනය (consolidation) කිරීම සහ අදාල අමාත්‍යාංශ ඉදිරිපත් කරනු ලබන අනුනීති පුනරීක්ෂණය (revision) කිරීම ද සිදු කරනු ලැබේ. පනත් කෙටුම්පත් පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා පාර්ලිමේන්තු තේරීම් කාරක සභා රැස්වීම්වලට සහභාගි වීම සහ පනත් කෙටුම්පත් විවාදයට ගැනීමේ දී පාර්ලිමේන්තුවට ගොස් අවශ්‍ය කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ අනුනීති සැකසීම සම්බන්ධයෙන් නොයෙකුත් අමාත්‍යාංශ හා රාජ්‍ය දෙපාර්තමේන්තුවලට නෛතික උපදෙස් ලබාදීම ද මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි.

'නීති කෙටුම්පත් සම්පාදක අංශය' යටතේ දක්වා ඇති පරිදි, 2013 වර්ෂයට අදාළව නීති කෙටුම්පත් සම්බන්ධව කටයුතු කර ඇත.

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
අංක 80, අධිකරණ මාවත,
කොළඹ 12.

சட்ட வரைஞர் திணைக்களம்,
இல.80, அதிகரண மாவத்தை,
கொழும்பு 12.

තැ.පෙ.
அ.பெ. 554
P.O.Box

LEGAL DRAFTSMAN'S DEPARTMENT,
N0.80, Adhikarana Mawatha,
Colombo 12.

දුරකථන / தொலைபேசி / Telephones : 542991, 333394

විදුලි පණිවුඩ : කෙටුම්පත්, කොළඹ
Telegrams : DRAFTSMAN, Colombo

ෆැක්ස් /பெக்ஸ் /Fax: 325185, 435935

E –mail : ldds1@sltnet.1k

මගේ අංකය. / எனது இல / My No. ගි.12/01 /2012-විගණන විමසුම්

ඔබේ අංකය. / உமது இல. / Your No. JP/C/DLD/2013/15

දිනය. / திகதி / Date. 2014.06.03

විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
බත්තරමුල්ල.

**විසර්ජන ගිණුම - 2013**

**ශීර්ෂ අංක 15 - නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**

සහතික කරන ලද ඉහත විසර්ජන ගිණුම සමග එවන ලද 2014.05.23 දිනැති විගණන නිරීක්ෂණ සම්බන්ධයෙනි. එම නිරීක්ෂණවලට අදාළ පැහැදිලි කිරීම් පහත දැක්වේ.

01. වැය විෂයයන් 02 ක් යටතේ වෙන් කර තිබූ එකතුව රු. 40,010,000 ක් වූ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරිවීමට හේතු පැහැදිලි කර පහත දක්වා ඇත.

| වැය විෂය | ප්‍රතිපාදනය | වියදම | ඉතිරිය | ප්‍රතිපාදන ඉතිරි වීමට හේතුව |
|---|---|---|---|---|
| 15-1-1-1401 | 10,000 | - | 10,000 | ගොඩනැගිලි අළුත්වැඩියා කටයුතු වල දී ප්‍රවාහන වියදම් අපේක්ෂා කළ ද අදාල ගිවිසුම් අත්සන් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් එවැනි අවස්ථා ඇති නොවීම. |
| 15-1-1-2502 | 40,000,000 | - | 40,000,000 | නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධන ව්‍යාපෘතිය සඳහා මෙම ප්‍රතිපාදන වෙන් කර තිබූ අතර, ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල කෙටුම්පත සම්පූර්ණ නොවීම මත අනුමැතිය ලබා ගැනීම ප්‍රමාද වීම නිසා මුදල් වියදම් කිරීමට නොහැකි වීම. |
| එකතුව | 40,010,000 | - | 40,010,000 | |

02. වැය විෂයයන් 04 ක් සඳහා වෙන් කරන ලද රු. 13,175,000 ක් වූ ප්‍රතිපාදනයෙන් රු. 8,010,733 ක් ඉතිරි වීමට හේතුව පහත දක්වා ඇත.

| වැය විෂය | ප්‍රතිපාදනය | ඉතිරිය | ප්‍රතිපාදන ඌන උපයෝජනය වීමට හේතුව |
|---|---|---|---|
| 15-1-1-1405 | 5,300,000 | 4,050,559 | සංස්කාරක / ලේඛන සහකාර හා භාෂා පරිවර්තක යන තනතුරු පුරප්පාඩු පිරවීමේ තරඟ විභාග පැවැත්වීමට අපේක්ෂා කළ ද තනතුරු සඳහා වූ බඳවා ගැනීමේ පරිපාටි අනුමත කර ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් අපේක්ෂිත වියදම් දැරීමට සිදු නොවීම. |
| 15-1-1-1505 | 375,000 | 193,000 | දෙපාර්තමේන්තුවට අවශ්‍ය පොත්පත් හා සඟරා මිලදී ගැනීමට මිල ගණන් කැඳ වූ නමුත් අදාල පොත් පත් සඳහා මිල ගණන් ඉදිරිපත් නොවීම හේතුවෙන් මිල දී ගැනීමට නොහැකි වීම. |
| 15-1-1-2102 | 500,000 | 290,400 | සහකාර නීති නිලධාරීන්ගේ කාමර සකස් කිරීමේ කටයුතු ප්‍රමාද වීම හේතුවෙන් ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ මිලදී ගැනීමේ අවශ්‍යතාවයක් ඇති නොවීම. |
| 15-1-1-2401 | 7,000,000 | 3,476,774 | විදේශ පුහුණු වැඩ මුළු සඳහා අපේක්ෂිත නිලධාරීන්ට වීසා නොලැබීම හේතුවෙන් එම වැඩමුළු සඳහා සහභාගීවීමට නොහැකි වීම. |
| එකතුව | 13,175,000 | 8,010,733 | |

03. මු.රෙ.94 විධිවිධාන ප්‍රකාරව දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදන මුදල් නොඉක්මවිය යුතු වුවත් වැය විෂයයන් දෙකක ඉතිරිවීම් ඉක්මවා රු. 325,279 ක් වූ බැරකම්වලට බැඳීමට හේතුව පැහැදිලි කර පහත දක්වා ඇත.

| වැය විෂය | 2013.12.31 දිනට ඉතිරිය | 2013.12.31 දිනට බැරකම | ඉතිරිය ඉක්මවූ බැරකම | පැහැදිලි කිරීම |
|---|---|---|---|---|
| 15-1-1-1402 | 58,099 | 166,287 | 108,188 | 2013 දෙසැම්බර් මාසයේ දුරකථන බිල්පත් 2014 ජනවාරි මාසයේ ලැබීම හේතුවෙන් බිල්පත්වල වටිනාකම කලින් නිශ්චය කිරීම නොහැකි වීම මත ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට බැඳීමට සිදුවිය. |
| 15-1-1-1403 | 43,567 | 260,658 | 217,091 | 2013 දෙසැම්බර් මාසයේ විදුලි බිල්පත් 2014 ජනවාරි මාසයේ ලැබීම හේතුවෙන් බිල්පත්වල වටිනාකම කලින් නිශ්චය කිරීම නොහැකි වීම මත ඉතිරිවීම් ඉක්මවා බැරකම්වලට බැඳීමට සිදුවිය. |
| එකතුව | 101,666 | 426,945 | 325,279 | |

ජී.එස්.ඒ. ද සිල්වා

නීති කෙටුම්පත් සම්පාදක.

ජී එස් ඒ ද සිල්වා
නීති කෙටුම්පත් සම්පාදක
නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
80 අධිකරණ මාවත
කොළඹ 12

2

## ආයතනයේ කාර්ය සාධනය ඉහළ නැංවීම පිණිස ගැනීමට අපේක්ෂිත මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

(i) විවිධ අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ පෞද්ගලික මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරනු ලබන පනත් කෙටුම්පත් කිරීම, හා පනත් සංශෝධන කෙටුම්පත් සඳහා වන ඉල්ලීම් කඩිනමින් සකස් කර භාෂාත්‍රයෙන් ඉදිරිපත් කිරීමට ගත යුතු පියවර පිළිබඳ සියළු නිලධාරීන් නිරතුරුවම දැනුවත් කර ඇත.

(ii) පළපුරුදු ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ හිඟය යම්තාක් දුරට මගහරවා ගැනීමට නීති කෙටුම්පත් කිරීමේ කාර්යයන් සඳහා උපදේශකවරුන් තිදෙනෙකු බඳවා ගෙන ඇත.

(iii) පනත් කෙටුම්පත් හා සංශෝධන පනත් කෙටුම්පත් වල භාෂා පරිවර්තන කටයුතු සඳහා ප්‍රමාණවත් භාෂා පරිවර්තන නිලධාරීන්ගේ හිඟකමක් පවතී. දෙමළ භාෂා පරිවර්තක නිලධාරී හිඟකම හේතුවෙන් දෙමළ භාෂා පරිවර්තන කටුයතු සඳහා රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දැනට සේවය කරන (නීති කෙටුම්පත් පරිවර්තනය කිරිම පිළිබඳ පළපුරුද්දක් ඇති) නිලධරයන්ගේ සහාය ලබා ගත යුතුව ඇත.

(iv) පනත් කෙටුම්පත් කිරීමේ ක්‍රියාවලියට සහාය වන ලේඛන හා සංස්කාරක තනතුරුවල පවත්නා පුරප්පාඩු අතරින් ප්‍රමාණවත් නිලධාරී සංඛ්‍යාවක් බඳවා ගැනීම සඳහා දැනට කටයුතු සිදු කෙරෙමින් පවතී.

(v) නිලධාරීන්ගේ දැනුම හා හැකියාව වර්ධනය කිරීම සඳහා දේශීය පුහුණු වැඩසටහන් හා විදේශීය සම්මන්ත්‍රණ හා වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කිරීමේ අවස්ථාවන් දිය යුතුව ඇත.

(vi) සියළුම නීති නිලධාරීන් සඳහා පරිගණක හා අන්තර්ජාල පහසුකම් ලබා දී නව තාක්ෂණය භාවිතා කිරීමට අවස්ථාව සලසා දිය යුතුව ඇත.

(vii) නිලධාරීන්ගේ හැකියාව වර්ධනය සඳහා 1 වන ශ්‍රේණියේ පුස්තකාලයක් ස්ථාපිතව ඇති අතර, විදේශීය නීති පොත් පරිශීලනය කිරීමේ පහසුකම් සපයා දී ඇත.

(viii) නීති නිලධාරීන් ඇතුළු දෙපාර්තමේන්තුවේ අනෙකුත් සියළුම කාර්ය මණ්ඩලය රාජකාරි වේලාවන්හි දී රාජ්‍ය සේවයේ ගෞරවය ආරක්ෂා වන පරිදි සේවයෙහි නියුතු විය යුතු බවට පැහැදිලි උපදෙස් නිරතුරුව ලබා දෙන අතර නීති නිලධාරීන් මෙන්ම අනෙකුත් සියළුම කාර්ය මණ්ඩලය ආදර්ශමත් පරිදි ස්වකීය රාජකාරි කටයුතු ඉටු කරනු ලබන බව ද සඳහන් කළ යුතු ව ඇත.